# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்று அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# 2024



වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

கரையோரம் பேணல் மற்றும் கரையோர மூலவள முகாமை திணைக்களம்

Coast Conservation and Coastal Resource Management Department

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்று அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# 2024


වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

கரையோரம் பேணல் மற்றும் கரையோர மூலவள முகாமை திணைக்களம்

**Coast Conservation and Coastal Resource Management Department**

# පටුන/ பொருளடக்கம்/ Table of Contents


| | | |
|---|---|---|
| පරිච්ඡේදය 01 | - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 05 |
| පරිච්ඡේදය 02 | - ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 11 |
| පරිච්ඡේදය 03 | - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 20 |
| පරිච්ඡේදය 04 | - කාර්ය සාධන දර්ශක | 43 |
| පරිච්ඡේදය 05 | - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 44 |
| පරිච්ඡේදය 06 | - මානව සම්පත් පැතිකඩ | 46 |
| පරිච්ඡේදය 07 | - අනුකූලතා වාර්තාව | 48 |

| | | |
|---|---|---|
| அத்தியாயம் 01 | - நிறுவனத்தின் விவரம் / நிறைவேற்றுப் பொழிப்பு | 53 |
| அத்தியாயம் 02 | - முன்னேற்ற மற்றும் எதிர்கால கண்ணோட்டம் | 59 |
| அத்தியாயம் 03 | - வருடத்திற்கான ஒட்டுமொத்த நிதிச் பெயலாற்றுகை | 69 |
| அத்தியாயம் 04 | - செயலாற்றுகை சுட்டிகள் | 88 |
| அத்தியாயம் 05 | - பேண்தகு அபிவிருத்தி இலக்குகளை (SDG) அடையும் செயலாற்றுகை | 89 |
| அத்தியாயம் 06 | - மனித வள விபரம் | 91 |
| அத்தியாயம் 07 | - இணக்கப்பாட்டு அறிக்கை | 93 |

| | | |
|---|---|---|
| Chapter 01 | - Institutional Profile / Executive Summary | 99 |
| Chapter 02 | - Progress and the Future Outlook | 105 |
| Chapter 03 | - Overall Financial Performance | 115 |
| Chapter 04 | - Performance Indicators | 134 |
| Chapter 05 | - Performance e of the Achieving sustainable Development Goals (SDG) | 135 |
| Chapter 06 | - Human Resource profile | 137 |
| Chapter 07 | - Compliance Report | 139 |

## 1.1 හැඳින්වීම

කොළඹ වරාය කොමිසම යටතේ වෙරළ ආරක්ෂණ ඒකකයක් 1963 දී ස්ථාපිත කරන ලද අතර, 1978 දී ධීවර කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශය යටතේ වෙරළ සංරක්ෂණ අංශය පිහිටුවන ලදී. ආර්ථික සම්පත් බහුල ශ්‍රී ලංකාවේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම මගින් වෙරළබඩ සම්පත් මත පදනම් වූ ආරක්ෂිත හා තිරසාර සංවර්ධනයකට ඉඩ ප්‍රස්ථා සැලසීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව, වෙරළ සංරක්ෂණ අංශය, 1984.01.01 දින සිට ලඒ ශ්‍රේණියේ ල  දෙපාර්තමේන්තුවක් වශයෙන් ස්ථාපිත කරන ලදී. දිවයිනේ වෙරළ තීරය සංරක්ෂණය කිරීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවට ඇති වගකීම අනුව දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන වාර්ෂික ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රමාණයක් යෙදවීමට සිදුව ඇත්තේ වෙරළ තීරයේ ස්ථායිකරණ වැඩසටහන් ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වේ. වෙරළ ස්ථායිකරණ වැඩසටහන් මගින්  වෙරළබඩ ක්‍රියාවලිය කළමනාකරණය කර වෙරළ කලාපයේ සිදුකරන සංවර්ධන කටයුතු වල තිරසාර බව පවත්වා ගන්නා ලෙසම වෙරළබඩ සංවර්ධන කටයුතු හා වෙරළ සම්පත් කළමනාකරණය කිරීම මගින් පරිසරයේ ගුණාත්මක බව පවත්වා ගැනීම ද වැදගත් වන බැවින් 1981 අංක 57 දරණ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ  පනත  මගින් ශ්‍රී ලංකාවේ වෙරළ කලාපයේ පරිපාලනය, පාලනය, භාරකාරීත්වය සහ කළමනාකරණය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජය වෙත පවරන ලදී. 1981 අංක 57 දරණ පනත 1988 අංක 64 සහ 2011 අංක 49 පනත්  මගින් සංශෝධිත අතර, පනතේ විධිවිධාන පරිපාලනය කිරීම, වෙරළ සංරක්ෂණය සහ වෙරළ සම්පත් කළමනාකරණය සඳහා වූ වැඩ යෝජනා සකස් කිරීම හා ඒවා ක්‍රියාවෙහි යෙදවීම, වෙරළ කලාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලැස්ම පිළියෙල කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම ඇතුලු පනතේ 4 වන වගන්තියේ සඳහන් කාර්යය සහ කර්තව්‍ය ඉටුකිරීම සඳහා වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත්කෙරිණි.

2019.12.10 දිනැති අංක 2153/12 දරණ  අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් මෙම දෙපාර්තමේන්තුව, පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි. 2020.08.09 දිනැති 2187/27 දරණ  අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නැවතත් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ නාගරික  සංවර්ධන , වෙරළ සංරක්ෂණ , අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගනු ලැබූ අතර 2021.07.07 දිනැති අංක 2235/45 දරණ  අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් වෙරළ සංරක්ෂණ සහ පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගනු ලැබීය. නැවතත් 2022.07.22 දිනැති 2289/43 දරණ  අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නැවතත් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතට ගනු ලැබිය.2024.09.27 දිනැති අංක 2403/53 දරණ අති විශේෂ ගැසට් නිවේදනය  මගින් පරිසර, වනජීවී, වනසම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යංශය යටතට ගනු ලැබූ අතර 2024.11.25 දිනැති අංක 2412/08 දරණ  අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පරිසර අමාත්‍යංශය යටතට ගනු ලැබීය.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

දකුණු ආසියානු කලාපය තුල තිබෙන දර්ශනීය, ආරකෂිත හා විවේකය ගත කිරීම සඳහා සුදුසුම වූ වෙරළ තීරයන් සහිතව වෙරළ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කර ඇති රට ලෙස ශ්‍රී ලංකාව ප්‍රමුඛත්වය ලබා ගැනීම



### මෙහෙවර

වෙරළ සම්පත් තිරසාර ලෙස සංවර්ධනය කිරීමත් වෙරළබඩ ක්‍රියාවලියන් කළමනාකරණය කිරීම මගින් ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික සහ පාරිසරික තත්වයන් ප්‍රශස්ථ මට්ටමක් කරා යොමු කිරීම වේ.

### අරමුණු

- වෙරළබඩ පරිසරයේ තත්ත්වය වැඩි දියුණු කිරීම.
- වෙරළ තීරය සංවර්ධනය කිරීම සහ කළමනාකරණය කිරීම.
- වෙරළබඩ යටිතල පහසුකම් ආරක්ෂණය කිරීම.
- වෙරළබඩ ප්‍රජාවගේ සහ සම්පත් භාවිතා කරන්නන්ගේ ජීවන තත්වය උසස් කිරීම.
- වෙරළ සම්පත් මත පදනම් වූ ආර්ථික සංවර්ධනය පහසු කර වීම සහ ප්‍රවර්ධනය කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

1. හදිසි වෙරළ ඛාදන තත්ත්වයන්ගේ බලපෑම අවම කිරීම.
2. දීර්ඝ කාලීන වෙරළ ආරක්ෂණ විසඳුම් ලබාදීම.
3. වෙරළතීර කළමනාකරණ ක්‍රමෝපායන් සැකසීම.
4. වෙරළ විමර්ශනය කිරීම.
5. සාගර තරංග මැනීම අධ්‍යනය කිරීම.
6. වෙරළ පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම.
7. අක් වෙරළ (near-shore) කලාපයේ සාගර පතුලේ වෙනස්කම් අධීක්ෂණය කිරීම.
8. වෙරළ සැලසුම් මාර්ගෝපදේශනය යාවත්කාලීන කිරීම.
9. වෙරළ අධීක්ෂණය සහ ඇගැයීම.
10. වෙරළ පරිහරණය කරන්නන්ට හිතකර තිරසාර වෙරළ ඉදි කිරීම් ඇති කිරීම.
11. වෙරළ කලාපය තුල වෙරළ ව්‍යුහ ඉදිකිරීමට මඟ පෙන්වීම.

12. වෙරළ ආපදා සිතියම් සැකසීම.(සුනාමි, සාගර මට්ටම ඉහළ යාම, සුළි කුණාටු සහ වෙරළ ඛාදනය)
13. වෙරළ ආරකෂණ සැලසුම් බාහිර ආයතන සඳහා ලබාදීම.
14. ගංගා මුවදොර කළමනාකරණය සඳහා ව්‍යුහ සැලසුම් කිරීමට සහය වීම.
15. වෙරළ ජල තත්ත්ව අධීක්ෂණ ව්‍යාපෘතිය සිදුකිරීම.
16. වෙරළ කලාප කළමනාකරණ සැලැස්ම යාවත්කාලීන කිරීම.
17. මුහුදු හිරිගල් ඉවත් කිරීම සහ මුහුදු වෙරළින් වැලි ඉවත් කිරීම පාලනය කිරීම.
18. වෙරළබඩ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් පාරිසරික තක්සේරු ලබා ගැනීම.
19. සංවර්ධන කටයුතු බලපත්‍ර වල අඩංගු කොන්දේසි වලට අනුකූල වන බව සහතික කිරීම.
20. පාඨශාලා සඳහා විෂයය මාලාවන් සංවර්ධනය කිරීම ඇතුලත්ව වෙරළබඩ ගැටළු පිළිබඳ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම.
21. වෙරළබඩ සම්පත් කළමනාකරණයේ දී ප්‍රජා සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම.
22. විශේෂ වෙරළ කලාප කළමනාකරණ සංකල්පය යටතේ වෙරළ ප්‍රජාවගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා සියළුදෙනාගේ සහභාගීත්වය මගින් වෙරළබඩ කළමනාකාරීත්වය සඳහා යොමු කිරීම.
23. බලපෑමට ලක්වන ප්‍රදේශ, සංරක්ෂණ ප්‍රදේශ හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම හා එම ප්‍රදේශ නිසි කලමනාකරණය කිරීම.
24. වෙරළ උද්‍යාන ඇති කිරීම.
25. වෙරළ ප්‍රවේශ සැලැස්මක් සකස් කිරීම මගින් වෙරළ පිවිසුම් පහසු කිරීම.
26. වෙරළ කලාපයේ අනවසර ඉදිකිරීම් හා අනවසර ඉඩම් හෝ ජලස්කන්ධ ගොඩකිරීම් පාලනය කිරීම.

ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ පැවති වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අංක.1651/20 දරණ 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයේ 04 වන පරිච්ඡේදයේ පරිදි වරාය හා ගුවන් සේවා අමාත්‍යාංශය යටතට පවරනු ලැබිණි.

අනතුරුව නැවතත් 2010.11.22 දිනැති අංක 1681/3 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශ නාමය 2011.10.07 දින සිට රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ලෙස සංශෝධනය විය.

2011 අංක 49 දරණ වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද අතර, නව සංශෝධනය වර්ෂ 2011 දෙසැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලදී. නව සංශෝධන පනත මගින් “වෙරළ සංරක්ෂණ” යන වචනය “වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ” ලෙස සංශෝධනය විය.

ඒ අනුව දෙපාර්තමේන්තු නාමය ද “වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව” ලෙස වෙනස් විය.

මෙම වෙරළ සංරක්ෂණ (සංශෝධන) පනත මගින් නව නීති ප්‍රතිපාදනයන් රාශියක් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ පනතට එක් වී ඇති අතර, එමගින් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය ද පුළුල් වී ඇත. එසේ එක් වූ නව නිති ප්‍රතිපාදන යන් මෙසේය.

- පනතේ නාමය “වෙරළ සංරක්ෂණ පනත වෙනුවට වෙරළ සම්පත් කළමනාකරණ පනත” ලෙස වෙනස් විම.
- සංශෝධිත පනතට අනුව “වෙරළ කළාපයට” අයත් ප්‍රදේශය පුළුල් විම.
- “වෙරළ කළාප හා වෙරළ සම්පත් කළමනාකරණ සැලසුම” සකස් කිරිම සඳහා නිති ප්‍රතිපාදන ලැබිම.
- බලපෑමට ලක් වු ප්‍රදේශ ,සංරක්ෂණ ප්‍රදේශ, වෙරළ උද්‍යාන හා විශේෂ කළමනාකරණ ප්‍රදේශ ලෙස නම් කිරීමට හා ඒ සඳහා රෙගුලාසි සකස් කිරීමට ප්‍රතිපාදන ලැබිම.
- වෙරළ කළාපයේ යම් අනවසර පිරවිමත් එම පිරවීම් ඉවත් කිරිම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට නිතිමය ප්‍රතිපාදන ලැබිම.

- අනවසර සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පොලිස් බලතල ලබාදීම.
- මෙම අනවසර සංවර්ධන කටයුතු සඳහා මහෙස්ත්‍රාත්වරයකුට ඇපලබාදිය නොහැකි බව හා අදාල දඩ මුදල් වැඩි කිරීම.
- මෙම අනවසර ක්‍රියාවන් සඳහා පාලනය කිරීම වෙනුවෙන් අදාල නිලධාරීන් දිරිමත් කිරීම සඳහා වෙරළ ආරක්ෂක ත්‍යග අරමුදලක් පිහිටුවීම.

නැවතත් 2015.09.21 දිනැති අංක 1933/13 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයක් මගින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහවැලි සංවර්ධන සහ පරිසර අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි.

අනතුරුව 2019.12.10 දිනැති අංක 2153/12 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් මෙම දෙපාර්තමේන්තුව, පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතට ගනු ලැබිණි. 2020.08.09 දිනැති 2187/27 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නැවතත් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ , අපද්‍රව්‍ය බැහැරලීම සහ ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගනු ලැබු අතර 2021.07.07 දිනැති අංක 2235/45 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් වෙරළ සංරක්ෂණ සහ පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට ගනු ලැබීය. නැවතත් 2022.07.22 දිනැති 2289/43 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් නැවතත් නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශය යටතට ගනු ලැබිය. 2024.09.27 දිනැති අංක 2403/53 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් පරිසර, වනජීවී, වනසම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යංශය යටතට ගනු ලැබු අතර 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් පරිසර අමාත්‍යංශය යටතට ගනු ලැබීය.

## 1.4 සංවිධාන සටහන



Organization Chart of Coast Conservation & Coastal Resource Management Department
Director General
Department of Coast Conservation
Additional Director General (Development)
Additional Director General (Coastal Engineering)
Director (Admin)
Chief Internal Auditor
Chief Accountant
Director (Coastal Resource Management)
Deputy Director (Planning & Monitoring)
Chief Engineer (Research & Design)
Chief Engineer (Coastal Development)
Deputy/Assistant Director (Admin)
Administrative Officer
Legal Officer
Legal Assistant
Accountant
Deputy Director (Coastal Resource Management)
Assistant Director (Head Office)
Assistant Director (Area Office)
Coast Conservation Chief Inspector
Field Officer/ Development Officer
Development Officer
Librarian
IT Assistant
Deputy Director (Research and Design)
Hydro Graphic Surveyor
Engineer (Civil)
Draughtsman
G.I.S. Officer
Deputy Director (Coastal Development)
Engineer (Mechanical)
Engineer (Civil) (Head Office)
Engineer (Civil) (Area Offices)
Chief Inspector Of Works
Technical Officer
Management Asst.
C.Con.Inspector/C.Con Sergeant/C.Con.Guard
Inspector of Works/ Field Labour/ Watcher
Office Assistant
Surveyor Assistant
Machine Operator/ Fitter/Carpenter/ Chainer/Electrician/ Welder/Tinker
Driller and Explorer
Bungalow Keeper
Driver

## 1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

| | |
|---|---|
| වෙරළ සංවර්ධන අංශය<br>වෙරළ පර්යේෂණ හා නිර්මාණ අංශය<br>වෙරළ සම්පත් කළමනාකරණ අංශය | ප්‍රධාන අංශ |
| සැලසුම් හා අධීක්ෂණ අංශය<br>පාලන අංශය<br>මූල්‍ය අංශය<br>නීති අංශය<br>අභ්‍යන්තර විගණන අංශය | සහයක අංශ |

## 1.6. අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුව /පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

අදාල නැත.

## 1.7 විදේශ අධාර ලබන ව්‍යපෘති තොරතුරු (තිබේ නම්)

| | |
|---|---|
| අ) ව්‍යාපෘතියේ නම<br>ආ) දායක නියෝජිතායතනය<br>ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි<br>ඈ) ව්‍යාපෘති කාල සිමාව | අදාල නැත. |

## 2.1 වැඩසටහන්/ ව්‍යාපෘති ප්‍රගතිය

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2024 වර්ෂයේ වෙන් කළ මුදල (රු. මිලි.) | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු.මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන වත්කම් වැඩි දියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම. | 2001 | කාර්යාල සහ නවාතැන්පොළවල ගොඩනැගිලි පුනරුත්තාපනය කිරීම. | 1.50 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 0.59<br>ප්‍රාදේශීය කාර්යාලවල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම. | 39.45% | |
| | 2002 | පිරියත යන්ත්‍රසූත්‍ර සහ අනෙකුත් උපකරණ නඩත්තුව | 9.00 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 8.92<br>කැණීම් යන්ත්‍ර 03ක්, බැකෝ ලෝඩර් 01ක් සහ රෝද ලෝඩර් 01ක් අලුත්වැඩියා කිරීම | 99.12% | |
| | 2003 | වාහන නඩත්තුව | 9.00 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 6.97<br>වාහන 25 ක් අලුත්වැඩියා කිරීම. | 77.43% | |
| **උප එකතුව** | | | **19.50** | | **16.48** | **84.52%** | |
| ප්‍රධාන වත්කම් අත්පත් කර ගැනීම | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 1.00 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 0.94<br>ඇඟිලි සලකුණු යන්ත්‍ර, උඩිස් ප්‍රොජෙක්ටරය, ලැප්ටොප් පරිගණකය, පරිගණක මොනිටර, ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගන්නා ලදී. | 94.10% | |
| **උප එකතුව** | | | **1.00** | | **0.94** | **94.10%** | |
| පුද්ගල හැකියාව වර්ධනය කිරීම. | 2401 | පුහුණු කිරීම් සහ පුද්ගලික හැකියා වර්ධනය කිරීම | 0.50 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 0.41<br>වැඩසටහන් 06ක් පවත්වන ලදී. | 82.20% | |
| **උප එකතුව** | | | **0.50** | | **0.41** | **82.20%** | |
| වෙරළ ඉංජිනේරුමය විමර්ශන | 291.1.1.0.2509-1 | වෙරළබඩ ඉංජිනේරුමය නිර්මාණ | 0.50 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 0.02<br>අභ්‍යන්තර ව්‍යාපෘති සඳහා ඉල්ලීම් 18 ක් සහ බාහිර ඉල්ලීම් 04 ක් | 4.00% | |
| | | ලවෙරළබඩ ඉංජිනේරුමය විමර්ෂණ | 8.00 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 5.91<br>වෙරළබඩ ප්‍රදේශ 16 ක් සඳහා සමීක්ෂණ අවසන් කරන ලදී. | 73.88% | |
| | | වෙරළබඩ ජල තත්ව පරීක්ෂාව | 3.00 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 1.69<br>කොළඹ සහ කළුතර දිස්ත්‍රික්කවල නාන ප්‍රදේශ 5 ක් සහ ඇළ මාර්ග මුහුදට ගලා යන ස්ථාන 72 ක් සඳහා අගයන් ලබා ගැනීම. | 56.33% | |
| | | වෙරළබඩ අධ්‍යයනයන් (Implementation of Nationally Determined Contributions (NDC)) | 3.00 | මූ.ප්‍ර<br>භෞ.ප්‍ර. | 0.00<br>ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික කමිටු වාර්තාව කෙටුම්පත් කරමින් පවතී. | 0.00% | |
| **උප එකතුව** | | | **14.50** | | | **7.62** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2024 වර්ෂයේ වෙන් කල මුදල (රු. මිලි.) | | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු.මිලියන) | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| වෙරළ කලාප කළමනාකරණ වැඩසටහන | 291.1.1.0.2509-2 | ස්ථිර තුරුලතා තීරය ලකුණු කිරීම (ත්‍රිකුණාමලය) | 1.50 | මූ.ප | 0.00 | 0.00% | |
| | | | | භෞ.ප්‍ර. | වැඩසටහන පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම හේතුවෙන් ප්‍රදේශයේ ප්‍රජාවෙන් යම් විරෝධතා එල්ල වූ අතර ගැටළුව විසඳීමට කාලය ගත විය. | | |
| | | ඊ - බලපත්‍ර ක්‍රියාවලිය | 4.00 | මූ.ප | 3.60 | 90.00% | |
| | | | | භෞ.ප්‍ර. | විද්‍යුත් බලපත්‍ර 1312ක් නිකුත් කරන ලදී. | | |
| | | අනවසර ඉදිකිරීම් කඩා ඉවත් කිරීම, අනවසර වැලි ඉවත් කිරීම් වැළැක්වීම සහ පසු විපරම් කිරීම | 1.00 | මූ.ප | 0.31 | 31.00% | |
| | | | | භෞ.ප්‍ර. | කඩා ඉවත් කිරීමේ නියෝග 469ක් නිකුත් කර ඇති අතර ඉන් 29ක් ඉවත් කර ඇත. | | |
| | | වෙරළ දූෂණය අවම කිරීම / වෙරළ පිරිසිදු කිරීම | 0.50 | මූ.ප | 0.51 | 102.00% | |
| | | | | භෞ.ප්‍ර. | වැඩසටහන් 102ක් පවත්වන ලදී. | | |
| | | පාරිසරික අධ්‍යාපනික/ දැනුවත් කිරීමේ වැඩසටහන් | 1.00 | මූ.ප | 0.79 | 79.00% | |
| | | | | භෞ.ප්‍ර. | වැඩසටහන් 6ක් පවත්වන ලදී. | | |
| | | වෙරළ සංරක්ෂණ සහ වෙරළ කලාපීය කළමනාකරණ සැලැස්ම සංශෝධනය කිරීම | 2.00 | මූ.ප | 1.10 | 55.00% | |
| | | | | භෞ.ප්‍ර. | CZ&CRM සැලැස්ම සංශෝධනය කරන ලද අතර සංශෝධිත සැලැස්ම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. | | |
| | | වෙරළ ප්‍රවේශ සැලැස්ම සඳහා හඳුනා ගැනීම සහ සිතියම්ගත කිරීම, වෙරළ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීම. | 24.00 | මූ.ප | 23.88 | 99.50% | |
| | | | | භෞ.ප්‍ර. | මන්නාරම, කිලිනොච්චිය, යාපනය, මුලතිව්, හම්බන්තොට, මාතර, ගාල්ල සහ කළුතර දිස්ත්‍රික්ක සඳහා සම්පූර්ණ කර වාර්තාව සහ සිතියම් ඉදිරිපත් කරන ලදී. | | |
| **උප එකතුව** | | | **34.00** | | **30.19** | **88.79%** | |
| වෙරළ ආරක්ෂක ව්‍යුහය ඉදි කිරීම | 291.1.1.0.2509-4 | කළුතර, කැලිඩෝ හි 1 වන අදියරේ මීටර් 400 ක රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම (2021 සිට අවිච්ඡේද) | 1.40 | මූ.ප | 1.31 | 93.57% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 410.0 ක බෑවුම් ප්‍රතිසංස්කරණය අවසන් කරන ලදී. | 100.00% | |
| | | උඩප්පුව උතුර ප්‍රදේශයේ මීටර් 200 රිවට්මන්ට් බැම්ම ඉදිකිරීම (පුත්තලම) | 27.50 | මූ.ප | 3.26 | 11.85% | |
| | | | | භෞ.ප්‍ර. | පාෂාණ ද්‍රව්‍ය සැපයීම සිදුවෙමින් පවතී. | 100.00% | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2024 වර්ෂයේ වෙන් කළ මුදල (රු. මිලි.) | | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු.මිලියන) | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| | | නින්දවූර් හි Groyne මාලාවක් ඉදිකිරීම - අදියර II (අම්පාර) | 22.00 | මූ.ප්‍ර | 16.11 | 73.23% | මෝසම් සුළං, පුපුරණ ද්‍රව්‍ය හිඟය සහ ඉදිකිරීම් සඳහා යන්ත්‍රෝපකරණ සැපයීමේ ගැටළු හේතුවෙන් ඉදි කිරීම් කටයුතු අඩාල විය. |
| | | | | භෞ.ප්‍ර. | අදියර I : 2024 දී ග්‍රෝයින් 02 ක් නිම කරන ලදී. අදියර II : ග්‍රෝයින් 04 ක ඉදිකිරීම - 02 ක ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත, 01 ක් ඉදිකරමින් පවතී. | 80.00% | |
| | | සයින්දමරදු සිට මාලිගායිකාඩු දක්වා ග්‍රොයින ශ්‍රේණියක් ඉදිකිරීම (අම්පාර) | 44.00 | මූ.ප්‍ර | 43.31 | 98.43% | |
| | | | | භෞ.ප්‍ර. | ග්‍රෝයින් 11 ක ඉදිකිරීම් අවසන් කරන ලදී. | 100.00% | |
| | | මුතූර් හි මීටර් 100 ගේබියන් බැම්ම ඉදිකිරීම (ත්‍රිකුණාමලය) | 3.00 | මූ.ප්‍ර | 3.03 | 101.00% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 100.0 ක ගේබියන් බැම්මේ ඉදිකිරීම් අවසන් කරන ලදී. | 100.00% | |
| | | මඩිහ ප්‍රදේශයේ වෙරළ ආරක්ෂණ ව්‍යුහය ඉදිකිරීම (මාතර) | 8.00 | මූ.ප්‍ර | 0.26 | 3.25% | |
| | | | | භෞ.ප්‍ර. | ප්‍රසම්පාදන කටයුතු දෙවරක් අවලංගු කිරීමට සිදු විය. | 0.00% | |
| | | හාතපලාන හි ෆමන්ට් ඇළ බෝක්කු ආරක්ෂාව සඳහා මීටර් 30.0ක ග්‍රොයිනයක් ඉදිකිරීම (ගාල්ල) | 6.00 | මූ.ප්‍ර | 0.11 | 1.83% | |
| | | | | භෞ.ප්‍ර. | යන්ත්‍ර කුලියට ගැනීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන ලදී. පාෂාණ ද්‍රව්‍ය සැපයීම සිදුවෙමින් පවතී. | 5.00% | |
| **උප එකතුව** | | | **111.90** | | **67.39** | **60.22%** | |
| වෙරළ ආරකෂක ව්‍යුහ අලුත්වැඩියා කිරීම | 291.1.1.0.2509-4 | ලුනාව, මොරටුව ප්‍රදේශයේ මීටර් 410 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම කොළඹ) (2021 සිට අවිච්ඡේද) | 3.60 | මූ.ප්‍ර. | 3.58 | 99.44% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 410.0 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය අවසන් කරන ලදී. | 100.00% | |
| | | රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම - මුදුකටුව (පුත්තලම) | 18.50 | මූ.ප්‍ර. | 19.66 | 106.27% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 200.0 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය අවසන් කරන ලදී. | 100.00% | |
| | | රිවට්මන්ට් බැම්ම අළුත්වැඩියා කිරීම - කහව (ගාල්ල) | 36.50 | මූ.ප්‍ර. | 33.15 | 90.82% | |
| | | | | භෞ.ප්‍ර. | මීටර් 200.0 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය අවසන් කරන ලදී. | 100.00% | |
| | | ග්‍රොයින ශ්‍රේණිය ප්‍රතිසංස්කරණය කිරීම - ඉරණවිල (පුත්තලම) | 22.50 | මූ.ප්‍ර. | 22.37 | 99.42% | |
| | | | | භෞ.ප්‍ර. | පවතින කණු 03 ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ නව කණු 03 ක් ඉදිකිරීම අවසන් කරන ලදී. | | |
| | | බණ්ඩාරමුල්ල, මිරිස්ස - මීටර් 120 ක ඇට්දීමේ මාර්ගය සහ රිවට්මන්ට් ඉදිකිරීම (මාතර) (2021 සිට අවිච්ඡේද) | 7.00 | මූ.ප්‍ර. | 0.00 | 0.00% | |
| | | | | භෞ.ප්‍ර. | ඇස්තමේන්තුව සංශෝධනය කරන ලදී. මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් කළ යුතු ව්‍යාපෘති වැඩබිමේ මායිම් සලකුණු කිරීමේ ප්‍රමාදයක් සිදුව ඇත. | 0.00% | |
| **උප එකතුව** | | | **88.10** | | **78.76** | **89.40%** | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2024 වර්ෂයේ වෙන් කල මුදල (රු. මිලි.) | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු.මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| හදිසි වෙරළ ආරක්ෂණ ව්‍යුහ | 291.1.1.0.2509-4 | මරතමුනෙයි හි සුනාමි අනුස්මරණ කුළුණට ආරක්ෂාව ගේබියන් බැම්ම ඉදිකිරීම. | | මූ.ප්‍ර. | 1.08 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | ගාල්ල, කොග්ගල ප්‍රදේශයේ මීටර් 60.0ක ගේබියන් බැම්මක් ඉදිකිරීම. | | මූ.ප්‍ර. | 3.02 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු - කළුතර උතුර සහ ඇලබඩවත්ත | | මූ.ප්‍ර. | 4.95 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි වෙරළ ආරක්ෂක කටයුතු - වස්කඩුව වෙරළ තීරය (රෝයල් පාම් හෝටලයට උතුරින්) | | මූ.ප්‍ර. | 13.09 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි වෙරළ ආරක්ෂක කටයුතු - ආබෘෂ පාර, කළුතර | | මූ.ප්‍ර. | 8.53 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු - ටැංජරින් - රෝයල් පාම් වෙරළබඩ ප්‍රදේශය, වස්කඩුව | | මූ.ප්‍ර. | 4.66 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු - ඉරණවිල, ලස්සන මිදුල, ආයතනය අසල | | මූ.ප්‍ර. | 3.35 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි ගංවතුර පාලන පියවර | | මූ.ප්‍ර. | 0.30 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | මුතුපන්තියේ මීටර් 200.0 වැලිවැටිය සහ ජම්බෝ බෑග් ආරක්ෂක වැටිය ප්‍රතිසංස්කරණය කිරීම | | මූ.ප්‍ර. | 0.51 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | හදිසි ජම්බෝ බෑග්/ පොලිසැක් බෑග් ආරක්ෂණ ඉදි කිරීම් | | මූ.ප්‍ර. | 3.32 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | කල්මුණේ හදිසි ආරක්ෂණ ග්‍රෝයිනයක් ඉදිකිරීම. | | මූ.ප්‍ර. | 3.95 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | මග්ගොන ප්‍රදේශයේ මීටර් 55.0 ක හදිසි රිවට්මන්ට් බැම්මක් ඉදිකිරීම. | | මූ.ප්‍ර. | 2.75 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |

| ශීර්ෂය | වැඩසටහන හා ව්‍යාපෘතිය | ක්‍රියාකාරකම් | 2024 වර්ෂයේ වෙන් කල මුදල (රු. මිලි.) | මූල්‍ය හා භෞතික ප්‍රගතිය (රු.මිලියන) | | (%) | පැන නැගී ඇති ගැටළු |
|---|---|---|---|---|---|---|---|
| | | හිරේවත්ත වෙරළ තීරයේ වෙරළ ප්‍රතිපෝෂණය | | මූ.ප්‍ර. | 0.42 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | ඉඳුරුව, AIDA හෝටලය අසල වෙරළ තීරයේ හදිසි වෙරළ ආරක්ෂණ ඉදිකිරීම් | | මූ.ප්‍ර. | 1.90 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | රැකව ධීවර වරායේ හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු | | මූ.ප්‍ර. | 0.29 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | වත්තල පල්ලියවත්තහි මීටර් 200 ක රිවට්මන්ට් බැම්ම ප්‍රතිසංස්කරණය කිරීම | | මූ.ප්‍ර. | 5.16 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | ගාල්ල, ගොඩගම හන්දියේ මහා මාර්ගය ආශ්‍රිත හදිසි වෙරළ ආරක්ෂණ කටයුතු | | මූ.ප්‍ර. | 0.39 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | බූස්ස වැල්ලබඩ හන්දියේ හදිසි වෙරළ ආරක්ෂක වැඩ | | මූ.ප්‍ර. | 0.64 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | යාපනයේ පේදුරුතුඩුවේ හදිසි වෙරළ ආරක්ෂක කටයුතු | | මූ.ප්‍ර. | 0.57 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | කරතීව් නාවික හමුදා කඳවුරේ හදිසි වෙරළ ආරක්ෂක කටයුතු | | මූ.ප්‍ර. | 1.15 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | වියන ලද නොවන (Non-woven) හුසළු 5000m2 මිලදී ගැනීම | | මූ.ප්‍ර. | 1.55 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | වෙනත් හදිසි වෙරළ වැඩ | | මූ.ප්‍ර. | 0.71 | | |
| | | | | භෞ.ප්‍ර. | ඉදිකිරීම් අවසන් කරන ලදී | 100.00% | |
| | | **උප එකතුව** | **51.5** | | **62.29** | **120.94%** | |
| | | **මුළු එකතුව** | **321.00** | | **264.08** | **82.27%** | |

## 2.2 අභියෝග

1. 2/2022 අයවැය චක්‍රලේඛයට අනුව, වෙරළබඩ ආරක්ෂක ව්‍යාපෘති රැසක් ඇතුළුව ව්‍යාපෘති කිහිප-යක්, අරමුදල් නොමැතිකම හේතුවෙන් 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් ඉවත් කර ඇත.

2. ආයතනයේ සම්පූර්ණ කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ඉංජිනේරුවන්, සහකාර අධ්‍යක්ෂවරුන්, ජල විද්‍යා සමීක්ෂකයින්, තාක්ෂණික නිලධාරීන් සහ දක්ෂ හා නුපුහුණු සේවකයින්ගේ හිඟය තීරණාත්මක බාධකයක් විය.

## 2.3 අනාගත ඉලක්ක

1. දෙපාර්තමේන්තුවට ආදායමක් උපයා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ වෙරළ තීරය තුළ සංචාරක විභව ස්ථාන සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වයන් (PPP).

2. වෙරළ ඛාදනය අඩු කිරීම සඳහා සැලසුම් අවශ්‍ය වේ

3. වෙරළබඩ සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම

## 2.4 ඊ - බලපත්‍ර ක්‍රියාවලිය

| ලද අයදුම්පත් සංඛයාව | ක්‍රියාවලියේ පවතින අයදුම්පත් සංඛ්‍යාව | නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව | ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | EIA/IEE ක්‍රියාවලිය යටතේ ඇති ව්‍යාපෘති |
|---|---|---|---|---|
| 1764 | 157 | 1312 | 295 (අවලංගු - ප්‍රතික්ෂේපිත) | EIA- 01<br>IEE- 10 |

| EIA | ව්‍යාපෘතිය |
|---|---|
| 01 | යෝජිත කාමර 113 කින් යුත් පරිසර සංචාරක නිකේතන ව්‍යාපෘතිය, එරුමතිව් දූපත, කල්පිටිය - Consulting Engineers and Architects Associated (Pvt)& Ltd. |

| IEE | ව්‍යාපෘතිය |
|---|---|
| 01 | යෝජිත SEA_ME-WE- (MSW6) සබ්මැරීන් කේබල් පද්ධති ව්‍යාපෘතිය - බ්‍රවුන්ස් හිල්ස්, මාතර වෙරළබඩ ප්‍රදේශය - ශ්‍රී ලංකා ටෙලිකොම් පුද්ගලික සමාගම |
| 02 | යෝජිත ඒකක 72 කින් යුත් අල්ලයි විලාස් නේවාසික සංවර්ධන ව්‍යාපෘතිය - උදරා 01, ඇලුමිනියම් කර්මාන්තශාලා පටුමග, අල්ලයිපිඩ්ඩි - ජේම්ස් විමලතාස් ජීවරාජ් |
| 03 | යෝජිත ඒකක 30 කින් යුත් නේවාසික මහල් නිවාස ව්‍යාපෘතිය - අංක 18, දුම්රිය ස්ථාන පාර, කොළඹ 06 - ගෝල්ඩන් ටවර් (පුද්) සමාගම |
| 04 | යෝජිත කාමර 08 කින් යුත් වෙරළ නිවාඩු නිකේතන ව්‍යාපෘතිය - රැකව, තංගල්ල) Stratterspear (Pvt.) Ltd. |
| 05 | යෝජිත ඒකක 48 කින් යුත් නේවාසික මහල් නිවාස ව්‍යාපෘතිය * අංක 41, වැවර්සෙට් පෙදෙස, කොළඹ 06 - නෝර්ත් පෝල් ඉංජිනේරු පුද්ගලික සමාගම |
| 06 | යෝජිත 10MW සුළං බල ව්‍යාපෘතිය - මුක්කුතොඩුවාව, පුත්තලම දිස්ත්‍රික්කය - Seamo Energy (Pvt) Ltd |
| 07 | යෝජිත ඒකක 134 කින් යුත් සාගරය ඉදිරිපස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය - අංක 28, චාර්ල්මන්ට් පාර, වැල්ලවත්ත, කොළඹ 06 - International Construction Consortium (Pvt.) Ltd. |
| 08 | යෝජිත ඒකක 103 ක් සහ විලා නිවාස 28 ක් යුත් නේවාසික මහල් නිවාස ව්‍යාපෘතිය - කුඩා වස්කඩුව, කළුතර - හෝම් ලෑන්ඩ්ස් ස්කයිලයින් (පුද්ගලික) සමාගම |
| 09 | යෝජිත කාමර 14 කින් යුත් බුටික් හෝටල් ව්‍යාපෘතිය - මහ කප්පින්න වලව්ව පාර, වලිවතුගොඩ, බලපිටිය - T&O Leisure Holdings (Pvt.) Ltd. |
| 10 | යෝජිත නේවාසික මහල් නිවාස ඒකක 125ක් සහ වෙනම සභාධිපත්‍ය නොවන විලා නිවාස 17ක් සහිත ව්‍යාපෘතිය - කුඩා වස්කඩුව, කළුතර - හෝම් ලෑන්ඩ්ස් ස්කයිලයින් (පුද්) සමාගම |

## 2.5 කඩොලාන තීර ප්‍රතිෂ්ඨාපනය කිරීම්

ගාල්ල, හම්බන්තොට, අම්පාර, ත්‍රිකුණාමලය, මන්නාරම, ගම්පහ, කළුතර යන දිස්ත්‍රික්කවල වර්ග මීටර් 2400 ක භූමි ප්‍රමාණයකින් යුත් ගස්/ කඩොලාන සිටුවීමේ වැඩසටහන් 20 ක් දිවයින පුරා පවත්වන ලදී.

## 2.6 වෙරළබඩ දූෂණය අවම කිරීම/වෙරල පිරිසිදු කිරීම්

| දිස්ත්‍රික්කය | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|
| පුත්තලම | 6 |
| ගම්පහ | 21 |
| කොළඹ | 8 |
| කළුතර | 4 |
| ගාල්ල | 7 |
| මාතර | 8 |
| හම්බන්තොට | 6 |
| අම්පාර | 15 |

| දිස්ත්‍රික්කය | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|
| මඩකලපුව | 16 |
| ත්‍රිකුණාමලය | 6 |
| මන්නාරම | 2 |
| කිලිනොච්චිය | 0 |
| යාපනය | 2 |
| මුලතිව් | 1 |
| **එකතුව** | **102** |

## 2.7 වෙරළාරක්ෂක ව්‍යුහ ඉදිකිරීම

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘති ගණන | ආරක්ෂා කරන ලද වෙරළ දිග (මීටර්) |
|---|---|---|
| පුත්තලම | 02 | 310 |
| ගම්පහ | | |
| කොළඹ | | |
| කළුතර | 03 | 235 |
| ගාල්ල | 02 | 120 |
| මාතර | | |
| හම්බන්තොට | | |
| අම්පාර | 05 | 1736 |
| මඩකලපුව | | |
| ත්‍රිකුණාමලය | 01 | 100 |
| මන්නාරම | | |
| යාපනය | | |
| වෙනත් හදිසි වෙරළ වැඩ | | 330 |
| **එකතුව** | **13** | **2831** |

## 2.8 වෙරළ ඛාදනය වැළැක්වීමට ගනු ලැබූ පියවර

| වෙරළ ආරක්ෂක ව්‍යාපෘතිය | ආරක්ෂා කරන ලද ඵලදායී වෙරළ දිග |
|---|---|
| වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම | මීටර් 1780 |
| හදිසි වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම | මීටර් 1051 |
| වෙරළ ආරක්ෂක ව්‍යුහ ප්‍රතිසංස්කරණය හා නඩත්තු කිරීම | මීටර් 1410 |
| **එකතුව** | **මීටර් 4241** |

## 2.9 නිර්මාණ හා පර්යේෂණ අංශය

| ක්‍රියාකාරකම | සිදු කරන ලද වැඩසටහන් |
|---|---|
| වෙරළබඩ ඉංජිනේරුමය නිර්මාණ සැලසුම් | සැලසුම් 22 (අභ්‍යන්තර ව්‍යාපෘති සඳහා සැලසුම් 18ක් සහ බාහිර ඉල්ලීම් සඳහා සැලසුම් 04ක්) ඉරණවිල/ මඩිහ, මාතර/ මුදුකටුව/ මුතූර්/ වන්නිමුණ්ඩල්, කල්පිටිය/ කල්මුණේ/ කල්ලාරු/ මැරීන් ඩ්‍රයිව්, ගාල්ල/ කොග්ගල, හබරාදූව/ ඉලන්තඩිය හෝටල් සඳහා වෙරළබඩ ව්‍යුහාත්මක සැලසුම් නිම කරන ලදී. කළුතර/ වන්කලෙයි, මන්නාරම/ කරුකාපොනේ/ නින්දවූර්/ කිරිමුන්දලම/ තල්දියවත්ත. |
| වෙරළබඩ ඉංජිනේරුමය සමීක්ෂණ | වෙරළබඩ ප්‍රදේශ 16 ක් සඳහා සමීක්ෂණ අවසන් කරන ලදී. |
| වෙරළබඩ අධ්‍යයනයන් | ජාතික වශයෙන් තීරණය කරන ලද දායකත්වයන් (NDCs) මත පදනම් වූ මුහුදු මට්ටමේ ඉහළ යාම පුරෝකථනය කිරීම සහ අවදානම් සිතියම් පූර්ව තක්සේරු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය සඳහා ඔෑක වාර්තාව කෙටුම්පත් කරමින් පවතී |

## 10 වෙරළබඩ ජලයේ ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම

| වෙරළ තීරය | පරාමිතීන් |
|---|---|
| **මුහුදේ දිය නාන ස්ථාන:**<br>1. ප්‍රීතිපුර, වත්තල<br>2. මෝරවල, පිටිපන<br>3. වීත්තුකාල, මීගමුව<br>4. තල්දියවත්ත, මීගමුව<br>5. ගල්කිස්ස මහ හෝටලය අසල<br><br>ඇළ මාර්ග මුහුදට විවෘත වන ස්ථාන : 72ක් | pH අගය<br>උෂ්ණත්වය - C<br>දියවූ ඔක්සිජන් ප්‍රමාණය - mg/l<br>විද්‍යුත් සන්නායකතාවය - µS<br>ලවණතාවය - µS<br>තෙල් සහ ග්‍රීස් - Mg/l<br>මළ අපද්‍රව්‍ය බැක්ටීරියා - #/100ml |

## 2.11 2024.12.31 දිනට ආදායම් ඉලක්ක/ ප්‍රගතිය

| Major Thrust Area | අයවැය කේතය | | මාසය | | | | | | | | | | | | මුළු මුදල (රු.මි) |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | මැයි | ජූනි | ජූලි | අගෝස්තු | සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් | දෙසැම්බර් | |
| කුලී ගාස්තු | 20.02.01.01-R | ඉලක්ක | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 0.20 | 2.40 |
| | | ප්‍රගතිය | 0.17 | 0.21 | 0.38 | 0.24 | 0.15 | 0.17 | 0.18 | 0.21 | 0.21 | 0.17 | 0.15 | 0.41 | 2.66 |
| ණය පොළී | 20.02.02.99.-R | ඉලක්ක | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 0.10 | 1.20 |
| | | ප්‍රගතිය | 0.13 | 0.14 | 0.14 | 0.14 | 0.16 | 0.15 | 0.15 | 0.15 | 0.15 | 0.14 | 0.15 | 0.16 | 1.77 |
| බලපත්‍ර සහ | 20.03.02.99-R | ඉලක්ක | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 3.50 | 42.00 |
| වෙනත් ගාස්තු | | ප්‍රගතිය | 2.61 | 3.77 | 5.90 | 2.68 | 2.34 | 2.44 | 20.95 | 3.14 | 7.27 | 16.97 | 3.96 | 4.16 | 76.18 |
| මුළු මුදල (රු.මි.) | | ඉලක්ක | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 3.80 | 45.60 |
| | | ප්‍රගතිය | 2.92 | 4.13 | 6.43 | 3.06 | 2.65 | 2.76 | 21.28 | 3.50 | 7.63 | 17.28 | 4.25 | 4.73 | 80.61 |

## 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | සත්‍ය 2024 රු. | සත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 574,689,000 | 504,398,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 28,123,927 | 23,501,019 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 12,100,809 | 11,874,654 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 614,913,736 | 539,773,673 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 614,913,736 | 539,773,673 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | - | - | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 614,913,736 | 539,773,673 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | | | |
| 279,500,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 296,951,472 | 261,454,683 | ඒසීඒ-2(ii) |
| 75,000,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 66,322,105 | 49,830,306 | |
| 3,500,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 2,614,706 | 2,910,014 | |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| 300,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 44,120 | 263,489 | |
| 358,300,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 365,932,403 | 314,458,492 | |
| | මූලධන වියදම් | | | | |
| 19,500,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 16,481,107 | 16,477,069 | ඒසීඒ-2(ii) |
| 1,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 940,961 | 309,550 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | |
| 500,000 | හැකියා වර්ධනය | 14 | 411,000 | 531,770 | |
| 300,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 247,039,529 | 231,271,252 | |
| 321,000,000 | මුළු මූලධන වියදම් (උ) | | 264,872,597 | 248,589,641 | |
| | තැන්පතු ගෙවීම් | | 32,888,167 | 24,842,386 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 16,715,330 | 12,930,813 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | 49,603,497 | 37,773,199 | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 680,408,497 | 600,821,332 | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | (65,494,761) | (61,047,659) | |
| | අග්‍රිම සැසඳුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (66,517,869) | (61,047,659) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 1,023,108 | - | ඒසීඒ-3 |
| | | 1 | (65,494,761) | (61,047,659) | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 724,302,986 | 683,355,595 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 42,999,624 | 38,385,103 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | |
| මුළු වත්කම් | | 767,302,610 | 721,740,698 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | 35,780,012 | 27,424,359 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 724,302,986 | 683,355,595 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(ආ) | - | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | | |
| අයිරා ශේෂය | ඒසීඒ-3 | 6,196,504 | 10,960,744 |
| මුළු වගකීම් | | 1,023,108 | - |
| | | 767,302,610 | 721,740,698 |

පිටු අංක 6 සිට 24 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් ප්‍රතිපත්ති සහ ඇමුණුම් පිටු අංක 25 සිට 30 දක්වා ඇතුළත් ගිණුම් සටහන් වලින් ද මෙම අවසන් ගිණුමෙහි අනිවාර්ය කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 චක්‍රලේඛයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් පොත්/ හා භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමෙන් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සිදු වෙනස් කිරීම් සිදුකිරීමට වර්ෂය පුරා අඛණ්ඩව සිදුකරන බවත් මෙයින් සහතික කරමි

| | | |
|---|---|---|
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන ගණකාධිකාරී |
| නම : කේ.ආර්.උඩුවාවල | නම : මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර | නම : කේ. තිරුකුමාර් |
| තනතුර : ලේකම්, පරිසර අමාත්‍යාංශය | තනතුර : අධ්‍යක්ෂ ජනරාල්, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ | තනතුර : ප්‍රධාන ගණකාධිකාරී, වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව |
| දිනය : 17/02/2025 | දිනය : 19/02/2025 | දිනය : 19/02/2025 |

කේ.ආර්. උඩුවාවල
ලේකම්
පරිසර අමාත්‍යාංශය
"සොබාදම් පියස", අංක 416/සී/1,
රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.

මහාචාර්ය පී.බී. ටර්නි ප්‍රදීප් කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව,
කොළඹ 10.

කේ. තිරුකුමාර්
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

[illegible]

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සත්‍ය | |
|---|---|---|
| | 2024 රු. | 2023 රු. |
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| බදු සහ ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| සාමාන්‍ය නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් බිරීම දෙපාර්තමේන්තුවෙන් එකතු කරන ලද ආදායම් | 93,373,377 | 59,195,936 |
| ඉම්ප්‍රස් ලැබීම් | 574,689,000 | 504,398,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 12,033,601 | 11,247,993 |
| තැන්පතු ලැබීම් | 28,123,927 | 23,501,019 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **708,219,905** | **598,342,948** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| පුද්ගල වේතන හා මෙහෙයුම් වියදම් | 361,583,722 | 309,361,886 |
| සහනාධාර සහ මාරු කිරීම් | 2,614,706 | - |
| වෙනත් වැය බිරීම දෙපාර්තමේන්තුවෙන් දරන ලද වියදම් | 29,460,162 | 2,708,221 |
| භාණ්ඩාගාරයට පියවන ලද ආදායම් | - | - |
| අත්තිකාරම් ගෙවීම් | 16,715,330 | 12,930,813 |
| තැන්පතු ගෙවීම් | 32,888,167 | 24,842,386 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **443,262,087** | **349,843,306** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **264,957,818** | **248,499,642** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | - | - |
| පොලී | - | - |
| ලාභාංශ | - | - |
| නිර්මාණ ඉවත්කිරීම් ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපකාර අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | | |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වියදම් | 263,934,710 | 248,499,642 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **263,934,710** | **248,499,642** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(263,934,710)** | **(248,499,642)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)= (ඇ) + (ඊ)** | **1,023,108** | - |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ලැබීම් | - | - |
| විදේශීය ණය ලැබීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | - | - |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ)= (උ)+(ඒ)** | **1,023,108** | - |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | - | - |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **1,023,108** | - |

3

## 3.4 පාඩු සහ නිදහස් කිරීම් ප්‍රකාශය

ඇමුණුම - (i)

### පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)

වියදම් ශීර්ෂ අංකය:291

දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ

වැඩසටහනේ අංකය හා නාමය: 01- මෙහෙයුම් වැඩසටහන

(i) වර්ෂය තුළ ලියා අයකර හැරීම්/කපාහැරීම්/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | 2 | 36,178 |
| රු | 25,000.01 | වැඩි | 2 | 110,325 |
| | එකතුව | | 04 | 146,503 |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1.යන්ත්‍ර හා උපකරණ අනතුරු | 01 | 29,000 |
| 2.වාහන අනතුරු | 01 | 21,058 |
| 3.ණය ශේෂ කපා හැරීම | 01 | 15,120 |
| 4.ඉන්ධන භාවිතය අඩුවීම | 01 | 81,325 |
| එකතුව | 04 | 146,503 |

(ii) පසුගිය වර්ෂයන්හි අයකර හැරීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය

| | අගය | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| රු | 25,000.00 | අඩු | | |
| රු | 25,000.01 | වැඩි | | |
| | එකතුව | | | - |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| එකතුව | | - |

(ii) අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | වටිනාකම | |
| වසර 5-10 | සිද්ධි සංඛ්‍යාව | |
| | වටිනාකම | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | වටිනාකම | රු |

සටහන - වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ නිශ්ශබ්ද කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී නිශ්ශබ්ද කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2025/02/17

ජේ. තිරුකුමාර්
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

* තම වාර්තාකරණ ආයතනයේ සමීප වාර්තාවලට අදාළව නොවන්නේ නම්, අවස්ථාවල නිල් වාර්තාවෙන් ඉදිරිපත් කළ යුතු ය.

## 3.5 පොත් වලින් කපා හැරීමේ ප්‍රකාශය

ඇමුණුම -(ii)

### පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

වියදම් ශීර්ෂ අංකය:291 | දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ

වැඩසටහනේ අංකය හා නාමය: 01- මෙහෙයුම් වැඩසටහන

1 වර්ෂය තුළ සිදුවූ මු.රෙ.109 යටතේ වන හානි හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය

| | අගය | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු.) |
|---|---|---|---|
| (i) | රු. 25,000.00 අඩු | 01 | 15,120 |
| (ii) | රු. 25,000.01 වැඩි | 01 | 29,000 |
| | එකතුව | 02 | 44,120 |

2 වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

| අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොකළ ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරීම සඳහා වූ අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|
| 1. GJ 7326 Vehicle වාහන අනතුරු | 21,058 | - | 21,058 | - | - | |
| 2. Hitachi Excavator යන්ත්‍ර හා උපකරණ අනතුරු | - | 29,000 | - | 29,000 | - | JE240502 |
| 3.W.W.K.ප්‍රේමරත්න - ණය ශේෂ කපා හැරීම | - | 15,120 | - | 15,120 | - | JE240901 |
| 4.W.B.D.De අල්විස් & 4-දෙනෙකු පොහොය අහිමිවීම | - | 81,325 | 81,325 | - | - | |
| එකතුව | 21,058 | 125,445 | 102,383 | 44,120 | - | |

සටහන - වගන්තිය (i) හි ඇතුළත් සිදුවීමක හළ යුතු හානි හා අත්හැරීම් හැර මු.රෙ. 109 යටතේ වන අනෙකුත් හානි හා අත්හැරීම් ප්‍රමාණය මෙම ආකෘතියේ ඇතුළත් කළ යුතු ය.

ප්‍රධාන ගණකාධිකාරී
දිනය : 2025/02/17

ජේ. සිරැකුමාර්
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

26

## 3.6 2024/12/31 දිනට බැඳීම් සහ වගකීම් ප්‍රකාශය

ඇමුණුම - (iii)

**දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය**

නැත

ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2025/02/17

ජේ. විජේකුමාර
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

27

## 3.7 වගකීම් ප්‍රකාශය (i)

ඇමුණුම - (iv)

### බැරකම් පිළිබඳ ප්‍රකාශනය - (i)

මු.රෙ.94 (2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ
වියදම් ශීර්ෂ අංකය:291
වැඩසටහනේ අංකය හා නාමය: 01- මෙහෙයුම් වැඩසටහන

| අමාත්‍යාංශයේ/ආයතනයේ නම | බැදීම් පිළිබඳ විස්තරය | විෂයශීර්ෂය | උප විෂයශීර්ෂය | වියදම් විෂය සංකේතය | ක්‍රියාකාරක සංකේතය | මු.රෙ. 94(2) හි සඳහන් ප්‍රතිපාදන අනුව එළඹිය හැකි උපරිම බැදීම් සීමාව (රු.) | මු.රෙ. 94(3) අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව (රු.) | බැදීම් සහ බැරකම් වටිනාකම (රු.) |
|---|---|---|---|---|---|---|---|---|
| 1. අමාත්‍යාංශය/රජයේ දෙපාර්තමේන්තු විවිධ අමාත්‍යාංශය | | | | | | | | |
| එකතුව | නැත | | | | | | | |
| 2. රාජ්‍ය සංස්ථා /ව්‍යවස්ථාපිත මණ්ඩල ..................... ..................... | | | | | | | | |
| එකතුව | නැත | | | | | | | |
| 3. වෙනත් (සංදේශලීන අංශය) SWOAD සොසයිටි | | | | | | | | |
| එකතුව | නැත | | | | | | | |
| මුළු එකතුව | | | | | | | | |

..............................
ප්‍රධාන ගණකාධිකාරී
දිනය : 2025/02/17

කේ. සිරිකුමාර්
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

28

## 3.8 අතුරුදහන් වූ වවුචර් ප්‍රකාශය

ඇමුණුම - (vii)

### අස්ථානගත වවුචර් පිළිබඳ ප්‍රකාශනය

දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ
වියදම් ශීර්ෂ අංකය:291
වැඩසටහන් අංකය හා නාමය: 01- මෙහෙයුම් වැඩසටහන

| දිනය | වවුචර් අංකය | ආදායකයාගේ නම | ගෙවීමේ ස්වභාවය | ගණන (රු) |
|---|---|---|---|---|
| | | | | |
| | | නැත | | |
| | | | | |

ප්‍රධාන ගණකාධිකාරී
දිනය : 2025/02/17

කේ. හිරාන්කුමාරි
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
පාලිකාවත්ත, කොළඹ 10.

* සෑම වාර්තාකරණ ආයතනයක් මෙම වාර්තාවලට අදාළව තොරතුරු නොමැති අවස්ථාවල නිල් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

29

## 3.9 2024/12/31 දිනට විවෘත කරන ලද බැංකු ගිණුම් පිළිබඳ තත්ව වාර්තාව

Annexure - (viii)

**උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ**
**2024.12.31 දිනට තත්ත්ව වාර්තාව**

වියදම් ශීර්ෂ අංකය : 291

දෙපාර්තමේන්තුවේ නම : වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ

| අනු අංකය | බැංකුවේ නම | ගිණුම් අංකය | 2024.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය | 2024.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය | 2024.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇත්නම්) | අවසාන වරට බැංකු ගැලපුම් සකස් කළ මාසය |
|---|---|---|---|---|---|---|
| | | | (රු.) | (රු.) | | |
| 1 | ලංකා බැංකුව | 7042641 | 31,315,832 | - | - | 2024 දෙසැම්බර් |
| 2 | ලංකා බැංකුව | 7040117 | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

.............................
ප්‍රධාන ගණකාධිකාරී

දිනය : 2025/02/17

කේ. හිරංකුමාර්
ප්‍රධාන ගණකාධිකාරී
වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත්
කළමනාකරණ දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත, කොළඹ 10.

30

## 3.10 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

| ආදායම් කේතය | ආදායම් සංග්‍රහයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසාන ඇස්තමේන්තුව | ප්‍රමාණය | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| 2003-02-99 | පරිපාලන ගාස්තු සහ ගාස්තු | 42,000 | 42,000 | 76,184 | 181 % |
| 2002-02-99 | පොලී-වෙනත් | 1,200 | 1,200 | 1,765 | 147 % |

## 3.11 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | සත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 385,120 | 385,120 | 365,869 | 95% |
| ප්‍රාග්ධන | 321,000 | 321,000 | 263,935 | 85% |

## 3.12 වෙනත් අමාත්‍යාංශයෙන් / දෙපාර්ත්මේන්තුවෙන් ප්‍රතිපාදන නොලැබුණි

අදාල නැත

## 3.13 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය 31/12/2024 | 2024/12/31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාවට අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි සහ ව්‍යුහ | 234,145 | 234,145 | | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ හා ප්‍රවාහන | 336,748 | 336,748 | | 100% |
| 9153 | ඉඩම් | 138,882 | 138,882 | | 100% |
| 9154 | අස්පෘෂ්‍ය වත්කම් | 14,528 | 14,528 | | 100% |

## 3.14 විගණකාධිපතිවරයාගේ වාර්තාව 2024

**ජාතික විගණන කාර්යාලය**
**தேசிய கணக்காய்வு அலுவலகம்**
**NATIONAL AUDIT OFFICE**

මගේ අංකය / எனது இல. / My No. } [illegible]/01/2024/09

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩිත වාර්තාව.**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරු ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් වලින් සමන්විත, 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | [illegible]@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ. මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1කි

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය

2

ජාතික විගණන කාර්යාලය
NATIONAL AUDIT OFFICE

ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ සහතිකවීමක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන සහතිකවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ

3

ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) හම්බන්තොට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය පැවරීමේ සහතිකය 2022 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට ලැබී තිබුණද, එය තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් දෙපර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්විණි.

(ආ) අයිතිය දෙපාර්තමේන්තුව සතුනොවූ හෙක්ටයාර් 0.7941 ක ප්‍රමාණයේ මිංතර, මොරටුව හා ගොඩවයේ පිහිටි ඉඩම් 03 ක් රු.42,007,000 කට තක්සේරු කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. මේ හේතුවෙන් මූල්‍ය නොවන වත්කම් එම වටිනාකමින් අධි තක්සේරු වී තිබුණි.

(ඇ) දෙපාර්තමේන්තුව සතුව පවතින යතුරුපැදි 08ක වටිනාකම තක්සේරු කර සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර

නොතිබුණි. ඉන් යතුරුපැදි 02ක් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ගිණුම්ගත කිරීමකින් තොරව අපහරණය කර තිබූ අතර තවත් යතුරුපැදියක් අස්ථානගත වී තිබුණි.

(ඇ) ව්‍යාපෘති කාර්යයන් සඳහා මොරටුව හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට අනුයුක්ත කර ඇති යන්ත්‍රෝපකරණ හතරක වටිනාකම් තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් වටිනාකම අඩුවෙන් දැක්වීණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි මූල්‍ය නොවන වත්කම් සම්බන්ධයෙන් වූ ඒසීඒ 06 ආකෘතිය ප්‍රකාරව, ඉදිකිරීම් උපකරණ හා ප්‍රවාහන උපකරණයන්හි අවසාන ශේෂ පිළිවෙලින් රු.140,290,875 ක් හා රු.141,940,000 ක් ලෙස දක්වා තිබුණද, විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛණවලට අනුව එම වටිනාකම් පිළිවෙලින් රු.139,500,000 හා රු. 145,400,000 ක් වූයෙන් පිළිවෙලින් රු.790,875 ක් හා රු. 3,460,000 ක වෙනසක් නිරීක්ෂණය විය

### 1.6.2 මූල්‍ය වත්කම්

2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශයේ ඒසීඒ 3 ආකෘතිය ප්‍රකාරව නොබේරුණු අග්‍රිම ශේෂය ලෙස පවතින රු. 1,023,108 ක් වූ මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු මුදල, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් ලෙස දක්වා නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට මුළු වත්කම් ශේෂය හා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළයුතු ශුද්ධ වත්කම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්වීණි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

5

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.4 (ආ) | ඉකුත් වර්ෂය තුළ හම්බන්තොට ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය පිහිටි ඉඩමේ අයිතිය පැවරීමේ සහතික ලැබී තිබුණ ද එය තක්සේරු කර එම වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. | 1.6.1 (අ) |
| 1.6.4 (ඇ) | අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවූවද ඉකුත් වර්ෂයන් හි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ රු.42,007,000 කට තක්සේරු කර දක්වා ඇති හෙක්ටයාර් 0.7941 ක ප්‍රමාණයේ මාතර, මොරටුව හා ගොඩවායේ පිහිටි ඉඩම් 03 හි අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට කටයුතු කළ යුතු වීම. | 1.6.1 (ආ) |
| 1.6.4 (ඈ) | දෙපාර්තමේන්තුව සතුව පවතින සියළුම යතුරුපැදි තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළ යුතු වීම. | 1.6.1 (ඇ) |
| 1.6.4 (ඉ) | ව්‍යාපෘති කාර්යයන් සඳහා මොරටුව හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට අනුයුක්ත කර ඇති යන්ත්‍රෝපකරණ හතරෙහි වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කළ යුතු වීම. | 1.6.1 (ඇ) |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 ආදායම් කළමනාකරණය**

(අ) ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් ආයතනය වෙත 2017 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබාදී ඇති බලපත්‍රවලින් අනුමතකළ වැලි කැණීම් ප්‍රමාණය ඉක්මවා වැලි කැනීම සිදුකිරීම සම්බන්ධයෙන් අයවිය යුතු මුදල රු.79,369,500 ක් විය. නමුත්, එම ආයතනය විසින් රු. 64,059,000ක් පමණක් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු

මුදල ලෙස ගණනය කර තිබුණි. කෙසේ වෙතත්, ගෙවිය යුතු මුළු මුදලෙන් සියයට 24ක් පමණ වන රු. 19,285,700 ක් පමණක් 2024 වර්ෂය අවසානය වනවිට ගෙවා තිබුණි. දෙපාර්තමේන්තුවේ ලේඛන අනුව, තවදුරටත් අයවීමට ඇති මුදල රු. 60,083,800 ක් අය කිරීමට කිසිදු ලිඛිත එකඟතාවයක් හෝ ගිවිසුමක් ඇතිකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.2 වියදම් කළමනාකරණය

සමාලෝචිත වර්ෂයේ වාහන නඩත්තු, මෘදුකාංග නඩත්තු, ගොඩනැගිලි නඩත්තු හා පුනරුත්ථාපනය වෙනුවෙන් වෙන්කර තිබූ ඇස්තමේන්තුගත ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් රු.4,194,946 හෙවත් සියයට 49ක්, රු.733,246ක් හෙවත් සියයට 73ක් හා රු.908,291ක් හෙවත් සියයට 61ක් ඉතිරිවී තිබුණි. එසේ වුවද වාහන සංචිතයේ පැවති වාහන 9ක අලුත් වැඩියා හා නඩත්තු කටයුතු තවදුරටත් පැවතීම, මිලපත්‍ර ආදායම් මුද්‍රණය සඳහා වාර්ෂික ගාස්තු ගෙවීමට පැවතීම, පරිගණක සඳහා මෙවරස් ගාඩ්වල අවශ්‍යතා පැවතීම සහ තවදුරටත් අලුත්වැඩියා කළ යුතු තත්වයේ ගොඩනැගිලි පැවතියදී ඒ වෙනුවෙන් වෙන්කළ ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි.

### 3.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්, වර්ෂය අවසානයේ බැදීම් සහ බැරකම් ප්‍රකාශනයට අනුව කිසිදු බැදීමක් හෝ බැරකමක් වාර්තාකර නොමැති වුවද, භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ එස්ඒ 92 ප්‍රකාරව වැය විෂයන් 3ක එකතුව රු.218,073ක්වූ බැරකම් පැවති අතර දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ ජනවාරි, පෙබරවාරි හා මාර්තු මාසවල වවුචර්පත් පරීක්ෂාවේදී වැය විෂයන් 10කට අදාලව එකතුව රු.3,818,244ක්වූ 2024 වර්ෂයේ වියදම් වෙනුවෙන් 2025 වර්ෂයේ ගෙවීම් කර තිබීමෙන් එකතුව රු.4,036,317ක වාර්තා නොවූ බැරකම් පැවතුණි.

(ආ) මු.රෙ. 94 (1) ට පටහැනිව 2024 දෙසැම්බර් 31 දිනට වැය විෂයන් 05ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා එකතුව රු. 2,473,462ක බැරකම් වලට එළඹ තිබුණි.

### 3.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනතේ 31 (4) වගන්තිය | 2015 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කඩා ඉවත් කිරීමේ නියෝග නිකුත්කරතිබූ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතු රු. 3,492,801 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 214 | අවශ්‍ය විස්තරාත්මක තොරතුරු ඇතුළත් කරමින් බැඳීම් හා බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | දෙපාර්තමේන්තුවේ වාහන 33 ක් හා යන්ත්‍ර 18 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඈ) | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2020 නොවැම්බර් 09 දිනැති අංක TOD/REV/M3/02/01 දරන ලිපිය | භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ගණන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක යටතේ එකතු කරනු ලබන ආදායම් පිළිබඳව අදාල ගණන් දීමේ නිලධාරීන් විසින් අර්ධ වාර්ෂිකව ආදායම් පිළිබඳව හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කළයුතු වුවත් 2019, 2020 හා 2021 වසරවලදී ධීවර වරාය පහකින් වැලි ඉවත් කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් අයවිය යුතු රු. 8,268,292ක හිඟ ආදායම් වාර්තාකිරීමට කටයුතු නොකර ඒ වෙනුවට කිසිදු හිඟ ආදායමක් නොමැති බවට වාර්තාකර තිබුණි. |

## 3.6 වෙනත් අමාත්‍යාංශ යටතේ ලබාදුන් ප්‍රතිපාදන

අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනේ Groyne field නිර්මිතය ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 46.99 ක ඇස්තමේන්තුවක් පිළියෙල කර තිබූ අතර එය 2024 අගෝස්තු 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා මාස 5ක් තුළ නිම කිරීමට සැලසුම් කර තිබුණි. ඒ සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදනය ජනාධිපති ලේකම් කාර්යාලය විසින් සලසා තිබුණු නමුත් එහි භෞතික කාර්ය සාධනය සියයට 40 ක මට්ටමකින් හා එහි මූල්‍ය කාර්යසාධනය රු.මි. 0.26ක් වූ සියයට 16.17 ක වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 දැක්ම හා මෙහෙවර

(අ) 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 7 (ඉ) හා 12 වගන්ති සහ 2018 වසරේ සංශෝධිත උපදේශක සභාව විසින් අනුමත කරන ලද වෙරළ කළමනාකරණ සැලැස්මේ 6.4.6 ඡේදය ප්‍රකාරව උපදේශක සභාවට බලපත්‍ර නිකුත් කිරීමේ බලයක් නොමැති අතර පොදු කටයුතු සඳහා මීස පස සිටුවෙන් නිදහස් ව පෞද්ගලික කටයුතු සඳහා බලපත්‍ර නිකුත් කිරීම පිණිස නිර්දේශ ලබාදීමේ බලයක් ද නොමැත. තවද සංවර්ධන කාර්යය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවක දී පමණක් ඉදිකිරීම් රහිත "වෙන්කළ ප්‍රදේශය" මහජනතාවගේ පෞද්ගලික නොවන පොදු සංවර්ධන කාර්යයන් සඳහා පමණක් වෙරළ පස සිටුවෙන් නිදහස් කිරීම අනුමත කිරීම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට කළ හැක. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද උපදේශක සභා රැස්වීම් වාරයන් 04ක දී වෙන් කරන ලද ප්‍රදේශයන් තුළ ඉදිකිරීම් සඳහා විරුද්ධත්වයක් නොමැති බවට පෞද්ගලික අයදුම්පත් සඳහා බලපත්‍ර 343 ක් ලබා දී තිබීම හේතුවෙන් බලපත්‍රයක් ලබාදීමෙන් අපේක්ෂිත වෙරළ කලාපය තුළ සංවර්ධන කටයුතු මගින් සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි.

(ආ) මිරිස්ස බන්ධරමුල්ල ප්‍රදේශයේ මීටර් 120ක දිගින් යුතු ශරීරසුවතා මංතීරුවක් ඉදිකිරීම හා වෙරළ ආරක්ෂක පැති බැම්මක් ඉදිකිරීම සඳහා රු.මි. 7ක මුදල් ප්‍රතිපාදන සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබුණි. කෙසේ වුවද වර්ෂය අවසානයට එම මුදල හා භෞතික ප්‍රගතිය ශුන්‍ය අගයන් ගෙන තිබූ අතර ශරීර සුවතා මන්තීරුවක් ඉදිකිරීම වෙරළ සංරක්ෂක දෙපාර්තමේන්තුවේ අරමුණ වලට පරිබාහිර ක්‍රියාකාරකමක් විය.

#### 4.1.2 සැලැසුම් කිරීම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ රු.මි. 21ක ප්‍රතිපාදන සලසා තිබූ වැය විෂයන් 05ක ළඟාකර ගැනීමට අපේක්ෂිත භෞතික හා මුදල් කාර්ය දර්ශන දක්වා නොතිබුණි.

10

**4.1.3 කාර්ය භාරයන් ඉටු නොකිරීම**

2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂය තුළ රු.මිලියන 16.5 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ මාතර මඩිහ ප්‍රදේශයේ වෙරළ ආරක්ෂක නිර්මිතයක් ඉදිකිරීම, වර්ෂ 2021 සිට ක්‍රියාත්මක වෙමින් පැවති මාතර, මිරිස්ස, බණ්ඩාරමුල්ල ප්‍රදේශයේ පැති බැම්මක් හා ශාරීර සුවතා මන්තිරුවක් ඉදි කිරීම හා ත්‍රිකුණාමලයේ ස්ථිර වෘක්ෂලතා රෝපණ සලකුණු කිරීම පිළිබඳ සමීක්ෂණය යන කාර්යයන් ඉටුකර නොතිබුණි.

**4.1.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

(අ) ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂයේදී නිමකිරීමට සැලසුම් කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මි. 52.52 වූ පුත්තලම් උතුරු උඩප්පුව ප්‍රදේශයේ මීටර් 200 කින් යුත් පැති බැම්මක් (Revetment) ඉදිකිරීම, ගාල්ල හපලාන මීටර් 30 ක දිගින් යුත් ගොයින (Groyne) නිර්මිතය ඉදිකිරීම හා අම්පාර දිස්ත්‍රික්කයේ පොතුවිල්, විස්කි පොයින්ට් හි Geobag Groyne නිර්මිතය ඉදිකිරීම යන ව්‍යාපෘති 03 හි භෞතික ප්‍රගතිය සියයට 20 කට වඩා අඩු මට්ටමක පැවති අතර එහි මූල්‍ය ප්‍රගතිය ද සියයට 12 කට වඩා අඩු මට්ටමක පැවතුණි.

(ආ) 2012 සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා ශ්‍රී ලංකා වෙරළ තීරයන්හි පිහිටුවූ ප්‍රදේශයන් තුළ බලපත්‍ර ලබා ගැනීමකින් තොරව සිදුකර ඇති ඉදිකිරීම් සඳහා කඩා ඉවත් කිරීමේ නියෝගයන් පනවා තිබූ අනවසර ඉදිකිරීම් 3,039 කින් 2,825ක් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.2** වත්කම් කළමනාකරණය

(අ) මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු.මිලියන 11.9 ක් වූ Volvo Excavator යන්ත්‍රය දීර්ඝ කාලයක සිට භාවිතයට නොගෙන ගාල්ල කාර්යාල පරිශ්‍රයේ දිරාපත්වෙමින් පැවති අතර අපහරණ කිරීම සඳහා 2021 වසරේ ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර තිබුණු නමුත් එම යන්ත්‍රය අපහරණ කිරීමට කටයුතු කර නොතිබුණි.

11

(ආ) මොරටුව ප්‍රාදේශීය කාර්යාලයේ Hyundai 320LC - 9 Crawler Excavator යන්ත්‍රය දීර්ඝ කාලයක සිට භාවිතා නොකර නවතා දමා තිබීමෙන් ධාවනය කළ නොහැකි තත්ත්වයට පත්ව තිබූ නමුත් ඒ පිළිබඳව වගකිවයුතු නිළධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) 2005 වර්ෂයේ ලියාපදිංචි කළ නමුත් ගිණුම්ගත කිරීමකින් තොරව පරිහරණය කරන ලද දෙපාර්තමේන්තුව සතු යතුරු පැදියක් අස්ථානගත වී තිබුණි. තවද, යතුරු පැදි සඳහා 2015 වර්ෂයෙන් පසුව ආදායම් බලපත්‍ර ලබාගැනීමට කටයුතුකර නොතිබුණු අතර අස්ථානගත වීම සම්බන්ධයෙන් මෙම වාර්තාවේ දින දක්වා කිසිදු පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 4.3 කළමනාකරණ දුර්වලතා

(අ) උණවටුන ප්‍රදේශයේ හෝටලයක ඉදිකිරීම සම්බන්ධයෙන් පරීක්ෂාවේදී ගාල්ල දිසා අධිකරණයේ පවරා තිබූ බෙදුම් නඩුවක් ප්‍රකාරව 1924 පෙබරවාරි 09 දින බෙදා වෙන් කරන ලද 9A පිඹුරෙහි වූ ඉඩම් කැබලි 06 හි ඇතුළත් ඉඩමේ ප්‍රමාණය පර්චස් 122.69 ක් වුවද 2018 අප්‍රේල් 30 දිනැතිව සාදන ලද පිඹුර ප්‍රකාරව එම ඉඩම් කැබලි 06 හි ප්‍රමාණය පර්චස් 156.11 ක් වීම නිසා වැඩිවී තිබූ පර්චස් 33.42ක ප්‍රමාණයක් මුහුදු වෙරළ නීති විරෝධී ලෙස ගොඩකර තිබීමක් බව නිරීක්ෂණය විය.

(ආ) ඉහත ඉඩමේ පෙර අයිතිකරු යන අය වෙරළ තීරයේ සිට මීටර 18.3 ක පමණ දුරින් අනවසරයෙන් ඉදිකරමින් පැවති දිග අඩි 21.9 හා උස අඩි 05 ක පමණ ප්‍රමාණයේ බැම්ම, පනතේ 31(2) වගන්තිය යටතේ කඩා ඉවත් කිරීමට 2016 නොවැම්බර් 09 දින වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියෝගයක් නිකුත් කර තිබුණද, එය නොසලකා හබරාදූව ප්‍රාදේශීය ලේකම්ගේ ලිපිය මඟින්, සෝදා පාළුව වැලැක්වීම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිර්දේශ යටතේ බැම්ම ඉදිකිරීම සඳහා ඉඩමේ වර්තමාන අයිතිකරු වෙත අවසර ලබාදීමට කටයුතු කර තිබුණි.

12

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

**5 තිරසර සංවර්ධනය**

**5.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම හා අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය**

අහිතකර මානව බලපෑම් වළක්වා ගැනීම සඳහා සාගර සහ වෙරළබඩ පරිසර පද්ධති තිරසර ලෙස සංරක්ෂණය කිරීම යන ඉලක්ක යටතේ බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනාගෙන කළමනාකරණය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුරු හා සංවේදී පරිසර පද්ධති හෙක්ටයාරය 70 ක් සංරක්ෂණය කිරීම යන ඉලක්කය කරා ළඟා වී නොතිබුණි.

**6 මානව සම්පත් කළමනාකරණය**

**6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, සත්‍ය කාර්ය මණ්ඩලය**

2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 541 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 150ක් පුරප්පාඩු වූ අතර ඊට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 15 ක්, තෘතීය හා ද්විතීක මට්ටම්වල තනතුරු 75 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 60 ක් ඇතුලත් විය. අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 90 ක් වුවද, සත්‍ය සංඛ්‍යාව 104 ක් වුයෙන් 14 ක අතිරික්තයක් විය. තවද, එක් තනතුරක් පමණක් අනුමත වූ ජ්‍යෙෂ්ඨ හා තෘතීය මට්ටමේ තනතුරු 3 ක, කිසිදු නිලධාරියෙක් සේවයේ නොයෙදී තිබුණි. ඒ අනුව සත්‍ය වශයෙන් පවතින තනතුරු සංඛ්‍යාව මත රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර අවශ්‍යතාවය අනුව සංශෝධනයන් සිදුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

H.S.S.

එච්.එස්.එස්.පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති(වැ.බ.) වෙනුවට

13

## 4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිදානය | | |
|---|---|---|---|
| | 100% -90% | 75% - 89% | 50% -74% |
| එලදායී ආරක්ෂිත වෙරළ දිග | 81% | | |
| එලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ තීරයේ දිග | | | 0% |
| පිරිසිදු කරන ලද වෙරළ දිග | 100% | | |
| සංරක්ෂණය කරන ලද සංවේදී කලාප වර්ග ප්‍රමාණය | | | 0% |
| ප්‍රතිශ්ඨාපනය කරන ලද කඩොලාන ප්‍රමාණය | 100% | | |
| වෙරළබඩ ජල තත්වය ව්‍ය 8ට වඩා වැඩි මට්ටමක තිබේදැයි පරීක්ෂා කිරීම | 100% | | |
| සංවර්ධන බලපත්‍ර නිකුත් කිරීමේ ප්‍රමාණය | 100% | | |
| දැනුවත් කිරීමේ වැඩසටහන් ප්‍රමාණය | 100% | | |

## 5.1 හඳුනාගත් අදාළ තිරසාර සංවර්ධන ඉලක්ක (SDG)

| ආයතනික අරමුණ අනුව ඉලක්ක | ක්‍රියාමාර්ග | ජයග්‍රහණය පිළිබඳ දර්ශකල | 2024 ඉලක්ක | 2024 ප්‍රගතිය | % 0- 49 | %50 - 74 | % 75 - 100 | SDG රාමුව තුළ ලබා දී ඇති අදාළ ප්‍රතිපත්ති ඉලක්කය |
|---|---|---|---|---|---|---|---|---|
| **දේශගුණික විපර්යාස සහ එහි බලපෑම් වලට එරෙහිව සටන් කිරීමට ඉක්මන් පියවර ගන්න** | | | | | | | | |
| 1. දේශගුණය ආශ්‍රිත වෙරළබඩ ආපදා හේතුවෙන් අහිතකර බලපෑම් වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු කිරීම | 1.1 වෙරළ ආරක්ෂක ව්‍යුහ ඉදිකිරීම.<br>1.2. කෘතිම වැලි පෝෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.<br>1.3. කඩොලාන තීර ප්‍රතිශ්ඨාපනය කිරීම | a. එලදායී ආරක්ෂිත වෙරළ දිග<br>b. ස්ථාවර කරන ලද එලදායී කෘතිම වැලි පෝෂිත වෙරළ දිග<br>C. වගා කරන ලද ප්‍රමාණය | 3500m<br>0<br>1000m2 | 2831m<br>0<br>2400m2 | <br>0<br> | | 81<br><br>100 | 13.1 සෑම රටකම දේශගුණය ආශ්‍රිත උවදුරු සහ ස්වභාවික විපත්වලට ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කිරීම |
| **තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුද සහ සාගර සම්පත් සංරක්ෂණය කිරීම සහ තිරසාර ලෙස භාවිතා කිරීම** | | | | | | | | |
| 2. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (ph) මැනීම සහ දත්ත හුවමාරු කිරීම | 2.1. වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් කෲයාත්මක කිරීම<br>2.2. වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් මැනීම | d. පිරිසිදු කරන ලද සමුච්චිත වෙරළ දිග<br>e. 2026 දක්වා සාමාන්‍ය වාර්ෂික වෙරළබඩ ජලයේ ph මට්ටම 8.0 ට වැඩියෙන් පවතීදැයි පරීක්ෂා කිරීම. | 2km<br>ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම. | 20.6km<br>ස්ථාන 04ක පරාමිතීන් මැනීම සහ දත්ත හුවමාරු කිරීම සිදු කර ඇත. | | | 100<br>100 | 14.1 2025 වන විට, සමුද්‍ර සුන්බුන් සහ පෝෂක දූෂණය ඇතුළුව, විශේෂයෙන්ම ගොඩබිම පදනම් වූ ක්‍රියාකාරකම් වලින්, සියලු වර්ගවල සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ සැලකිය යුතු ලෙස අඩු 14.3 සෑම තරාතිරමකම වැඩිදියුණු කරන ලද විද්‍යාත්මක සහයෝගීතාවය ඇතුළුව සාගර ආම්ලිකතාවයේ බලපෑම් අවම කිරීම සහ ඒවාට විසඳුම් සෙවීම |
| 3. සමුද්‍ර දූෂණය වැළැක්වීම සහ අඩු කිරීම සහ විවිධ ස්ථානවල වෙරළබඩ ජල තත්ත්ව පරාමිතීන් (ph) මැනීම සහ දත්ත හුවමාරු කිරීම | | වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුරු හා සංවේදී පරිසර පද්ධති සංරක්ෂණය කරන ලද ප්‍රමාණය | 70 Hec | 0 | 0 | | | 14.5 2020 වන විට, ජාතික හා ජාත්‍යන්තර නීතියට අනුකූලව සහ පවතින හොඳම විද්‍යාත්මක තොරතුරු මත පදනම්ව වෙරළබඩ සහ සමුද්‍ර ප්‍රදේශවලින් අවම වශයෙන් සියයට 10 ක් සංරක්ෂණය කරන්න. |

## 5.2 තිරසාර සංවර්ධන අරමුණු වල ජයග්‍රහණ සහ අභියෝග කෙටියෙන් විස්තර කරන්න

හඳුනා ගත් තිරසාර සංවර්ධන ඉලක්ක කරා හැකි උපරිමයෙන් ළඟා වීමට උත්සාහ කරන අතර ඉන් සමහරක් ඉලක්ක පාර්ශවකාර ආයතන සමග එකමුතුව ඉටු කර ගත යුතු ව ඇත.

## 6. 1 සේවක කළමනාකරණය

| | අනුමත සේවක | පවතින සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 43 | 28 | 15 |
| තෘතික | 04 | 01 | 03 |
| ද්විතික | 322 | 265 | 57 |
| ප්‍රාථමික | 172 | 112 | 60 |
| **මුළු එකතුව** | **541** | **406** | **135** |

## 6.2 ආයතනයේ ක්‍රියාකාරීත්වයට මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.

01) ඉදිකිරීම් ස්ථානවල භෞතික හා මූල්‍යමය ප්‍රගතිය අත්කර ගැනීමේදී ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන් සහ ක්ෂේත්‍ර සහායකයින් හිඟය අහිතකර ලෙස බලපානු ලැබේ.

02) සංවර්ධන නිලධාරීන් (14) වැනි සමහර කාණ්ඩවල අතිරික්ත සේවක සංඛ්‍යාව අනවශ්‍ය මුදල් වියදම්වලට හේතු වන අතර මූල්‍ය කාර්ය සාධනයේ කාර්යක්ෂමතාව අඩු කරයි.

## 6.3 මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණුව ලත් කාර්ය මණ්ඩලය | වැඩසටහනේ කාල සීමාව | මුළු ආයෝජනය (රු.1000) දේශීය | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | දැනුම ලබා ගැනීම |
|---|---|---|---|---|---|
| ලංසු කැඳවීම් ලේඛන පිළියෙල කිරීම | 01 | 2024.07.03,04,05 | 21 | දේශීය | |
| රජයේ ගෙවීම් ක්‍රමවේදය | 01 | 2024.08.13,14,15 | 18 | දේශීය | |
| රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 01 | 2024.06.14 සිට සිකුරාදා දින 10ක් | 40 | දේශීය | |
| අභිප්‍රේරණ වැඩසටහන | 25 | 2024.10.22 | 142.5 | දේශීය | |
| ධනාත්මක ආකල්ප සංවර්ධන වැඩසටහන | 25 | 2024.10.23 | 142.5 | දේශීය | |
| චීන දූපත් රටවල සාගර සංසදය | 01 | 2024.11.04 - 05 | 29.2 (උණුසුම් ඇඳුම් දීමනාව) | විදේශ | |
| සංවර්ධනය වෙමින් පවතින රටවල වෙරළබඩ කලාපයේ සමුද්‍ර භූ විද්‍යා සමීක්ෂණය සහ පාරිසරික ආරක්ෂාව පිළිබඳ සම්මන්ත්‍රණය | 03 | 2024.08.29*09.13 | 88.4 (උණුසුම් ඇඳුම් දීමනාව) | විදේශ | |

## ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න

- ආයතනයේ විවිධ විෂයන් පිළිබඳ දැනුම යාවත්කාලීන වීම තුලින් ඵලදායිතාව ඉහල නැංවීමට හැකි වීම.
- පුහුණු වැඩසටහන් තුලින් ආකල්ප හා පුද්ගල සංවර්ධනය, සාමූහික වගකීම් වැඩි දියුණු වීම.
- සේවකයින්ගේ සේවා අවශ්‍යතා හඳුනා ගැනීම් තුලින් ඔවුන් ඵලදායි මට්ටමට ලගා වීමට අවශ්‍ය පහසුකම් සැපයීම කඩිනම් වීම.
- පුහුණුව තුලින් ලබා ගන්නා දැනුම නව ක්‍රමවේද හා කාර්යක්ෂම කාර්යාල ක්‍රම තුලින් සේවක අභිප්‍රේරණය ඇති කිරීමට හැකි වීම.

| අංකය | අයදුම් කිරීමේ අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල / අනුකූල නොවේ) | අනුකූල නොවීම සඳහා කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම සඳහා යෝජනා කරන ලද නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | වෙළඳ හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | | |
| **2** | **පොත් සහ ලේඛණ නඩත්තු කිරීම (FR445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ (267/2018) අනුව ස්ථාවර වත්කම් ලේඛණ නඩත්තු කර යාවත්කාලීන කර ඇත. | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගලික දීමනා ලේඛනය / පුද්ගලික දීමනා කාඩ්පත් නඩත්තු කරිම සහ යාවත්කාලීන කරිම. | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය නඩත්තු කිරිම සහ යාවත්කාලින කිරිම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලියාපදිංචි කර නඩත්තු කර යාවත්කාලීන කර ඇත. | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම් සාරාංශනියමිත දිනට භාණ්ඩාගාරයට (CIGAS) සකස් කර ඉදිරිපත් කරනු ලැබේ | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් ලේඛනය පවත්වා ගෙන යාම යාවත්කාලීන කර ඇත. | අනුකූල වේ | | |
| 2.7 | භාණ්ඩ වට්ටෝරු ලේඛනය යාවත්කාලීන කර යාවත්කාලීන කර ඇත | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත | අනුකූල වේ | | |
| 2.9 | පාඩු ලේඛනය නඩත්තු කර යාවත්කාලීන කර ඇත | අනුකූල වේ | | |
| 2.10 | බැඳීම් ලේඛනය නඩත්තු කරිම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූලවේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA- N20) යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම** | **(මු.රෙ135)** | | |
| 3.1 | මූල්‍යය ආයතනය තුල පවරා ගැනිම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදිම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කිරිම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනකු හෝ ඊට වැඩි සංඛ්‍යවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබිම<br>such manner so as to pass each transaction through two or more officers | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිත් මෘදුකාංග පැජකේජය භාවිතා කිරීමේදි ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම<br>prepared and submitted to the NBD on due date | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.<br>submitted to the Treasury Operations Department on time | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදි විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සලස්ම සකස් කිරීම<br>prepared at the beginning of the year after consulting the Auditor General in terms of Financial Regulation134(2)) DMA/1-2019 | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිලිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | ප්‍රාදේශිය කාර්යාල මගින් තොරතුරු ලබා ගැනීමේදී සැලකියයුතු කාලයක් ගතවේ. | කඩිනමින් පිළිතුරු ලබා දෙන ලෙස උපදෙස් දී ඇත. |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණය විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව ,සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රෙල්ක 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම. | අනුකූල වේ | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රෙල්ඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රෙල්ඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව ,එම චක්‍රෙල්ඛයේ විධි විධාන ක්‍රියාත්මක | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත්කර එම නිලධාරියා පිළිබඳව තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වු අතිරික්ත ,ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දි අපහරණය කර තිබීම | අනුකූල නොවේ. | කැබිනට් තීරණයට අනුව විකිණීමේ ක්‍රියා පටිපාටිය ප්‍රමාද වී තිබුණි | |
| 9.3 | වාහන ලොග් පොත පවත්වා ලනිමින් ඒවා යාවත්කාලින කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක්ම සම්බන්ධයෙන් ම ම.රෙ.103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය විම නැවත පරික්ෂා කිරීම. | අනුකූල නොවේ. | ප්‍රමාණවත් ඉන්ධන ප්‍රතිපාදන නොමැතිකම නිසා සිදු කළ නොහැකි විය. | 2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත |
| 9.6 | කල්බදු කාල සමාවෙන් අනතුරුව , බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අදාල නොවේ. | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දි හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වු හා ගැලපුම් කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබු ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රේ 94(1) ප්‍රකාරව ,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දි ඉතිරි ප්‍රතිපාදනසීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම | අනුකූල නොවේ | 2024 වර්ෂයේදී නොවැළැක්විය හැකි වියදම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන ලබා දී නොමැත | ප්‍රතිපාදන ඇතුළත වියදම් පියවා ගැනීමට පියවර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිග හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිග හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ම.රේ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම ,එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | මේවා තාවකාලික උප අග්‍රිම පියවීමට ප්‍රමාද වූ දේවල් විය. | උප අග්‍රිම මාසයක් ඇතුළත පියවීමට උපදෙස් දෙනු ලැබේ. |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **අදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුක්ලව, රැස් කළ අදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අදාළ නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ අදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම අදායමට බැර කර තිබීම | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිග අදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | සංවර්ධන නිලධාරී තනතුරු වල අතිරික්තයක් පවතී | එම අතිරික්ත ප්‍රමාණය අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට ලිපි යවා ඇත. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යෑම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පණතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රෙල්බයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රෙල්බ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රෙල්බයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩත සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රෙල්බයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්ම පිළියෙළ කිරීම.ධාරිතා සංවර්ධනය කිරීම නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |